EWIS PERIPHERALS (PVT) LTD.
10
12 SEP 2025
RECEIVED

මගේ අංකය:- පුත්/මහාධි/ප්‍රසම්පාදන/15/2025

කළමණාකරු,

ඊවිස් පෙරිපරල්ස් ආයතනය,

නො. 142,

යතාමා ගොඩනැගිල්ල,

ගාලු පාර, කොළඹ - 03

**<u>පුත්තලම මහාධිකරණයට අයත් අධිකරණවල භාවිතා කරන පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර සමඟ ජාලගත කිරීමට  අදාළව මිල ගණන් කැඳවීම සම්බන්ධවයි.</u>**

පහත සඳහන් අධිකරණවල භාවිතා කරනු ලබන පරිගණක යන්ත්‍ර, එකී අධිකරණවල භාවිතා කරණ ඡායා පිටපත් යන්ත්‍ර සමඟ ජාලගත කර  පිටපත් මුද්‍රණය කර ගැනීමේ පහසුකම් ලබා ගැනීමේ අවශ්‍යතාවය පැන නැගී ඇත.

1. මහාධිකරණය - පුත්තලම.
2. දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - පුත්තලම
3. නව පෙරනිමි අධිකරණය - පුත්තලම
4. මහෙස්ත්‍රාත් අධිකරණය - ආණමඩුව

02. ඒ අනුව, ඉහත  අධිකරණවල කාර්යාල පරිශ්‍රය පරීක්ෂා කර බලා පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර සමඟ ජාලගත කිරීමට  අදාළව ඔබ ආයතනයේ මුද්‍රා තබන ලද මිල ගණන් **2025.09.29** වන දින **ප.ව.1.30** ට පෙර **රෙජිස්ට්‍රාර්, මහාධිකරණය, පුත්තලම** යන ලිපිනයට කඩිනමින් ඉදිරිපත් කරන ලෙස කාරුණිකව  දන්වා සිටින අතර,  මිල ගණන් බහාලන කවරයේ ඉහළ වම්පස **"පරිගණක යන්ත්‍ර, ඡායා පිටපත් යන්ත්‍ර සමඟ ජාලගත කිරීමට"** යනුවෙන් සඳහන් කර එවිය යුතුය.

03. 2025.09.29 දින ප.ව.1.30 පසුවූ වහාම පුත්තලම මහාධිකරණ විවෘත අධිකරණ ශාලාවේදී අදාළ මිල ගණන් විවෘත කරනු ලබන අතර, ඉන් පසුව ලැබෙන මිල ගණන් භාර ගනු නොලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ඔබට හෝ ඔබ විසින් විධිමත් ලෙස බලය පැවරූ නියෝජිත මහතෙකුට සහභාගී වීමට පුළුවන. (තැපෑලේදී නැතිවෙන හා ප්‍රමාද වන මිල ගණන් සම්බන්ධයෙන් අප ආයතනය වග කියනු නොලැබේ.)

04. ඔබ ආයතනය විසින් ඉදිරිපත් කරන මිල ගණන් ලංසු විවෘත කරන දිනය වන 2025.09.29 දින සිට 2025.10.30 දින දක්වා ඉදිරියට වලංගු විය යුතුය.

05. අදාළ සේවාව ලබා ගැනීම සඳහා සුදුසු ආයතනය තෝරා ගැනීම  සම්බන්ධයෙන් වන අවසාන තීරණය පුත්තලම මහාධිකරණ ප්‍රසම්පාදන කමිටුව සතුය.